2024

කාර්ය සාධන වාර්තාව

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ රබර් වගාව දේශගුණ විපර්යාස හේතුවෙන් කිරි කැපිය හැකි දින ගණන අඩුවීම, සාම්ප්‍රදායික ප්‍රදේශවල ඉඩම් සඳහා වන ඉල්ලුම ඉහළ යාම නිසා රබර් වගා කල හැකි ඉඩම් විකල්ප පරිහරණයට යොමුවීම, කිරි කැපීම සඳහා වන පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය, පත්‍ර පතන රෝග ව්‍යාප්තිය, වැඩි අස්වනු ලබාදෙන නව ක්ලෝනවල හිඟතාවය, පොහොර මිල ඉහළ යාම වැනි අභියෝග රාශියකට මුහුණ දෙමින් සිටී.

එම අභියෝගයන්ට විසඳුම් සොයමින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 2024 වසර තුල ශ්‍රී ලංකාවේ රබර් වගාව නගා සිටුවීම සඳහා ව්‍යාප්ති සේවා, පුහුණු හා සංවර්ධන සහායන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ සඳහා දෙපාර්තමේන්තුව වෙත ප්‍රාග්ධන ආයෝජන ලෙස රුපියල් මිලියන 546 ක ප්‍රතිපාදන වෙන්විය. ඉන් රුපියල් මිලියන 538 ක් වියදම් දරමින් 98.46% ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගැනීමට 2024 වසරේදී දෙපාර්තමේන්තුව සමත්වී ඇත.

2023/2024 පාදක වර්ෂය කරගනිමින් ක්‍රියාත්මක කරන ලද රබර් ඉඩම් සමීක්ෂණය අවසන් කිරීමට හැකිවීම 2024 වසරේදී දෙපාර්තමේන්තුව ලද සුවිශේෂී ජයග්‍රහණයකි. සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සමස්ත රබර් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 84,002 වන අතර, කුඩා වතු හිමියන් සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 48,292 හා වතු සමාගම් සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 35,710 වේ.

එසේම 2024 වසරේ රබර් අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියනය ඉක්මවා යාමට රබර් ක්ෂේත්‍රයට හැකියාව ලැබීම සතුටට කරුණකි.

2023 වසරට සාපේක්ෂව ස්වභාවික රබර් නිෂ්පාදනය ඉහළ ගොස් තිබියදී රබර් ආනයන ප්‍රමාණයද ඉහළ යාම මඟින් පෙන්නුම් කරනුයේ දේශීය රබර් පරිභෝජනයේ වැඩිවීම වේ. එබැවින් දේශීයව රබර් නිෂ්පාදනය වැඩිකර ගැනීම සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම කෙරෙහි තවදුරටත් අවධානය යොමුකල යුතුව ඇත.

රෝහණ එස්. හපුගස්වත්ත
අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

පටුන

1. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 01-07

1.1. හැඳින්වීම 01
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 02
1.3. ආයතනයේ ප්‍රධාන කාර්යයන් 03
1.3.1. ප්‍රධාන කාර්යාලයේ කාර්යයන් 03
1.3.2.ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරන කාර්යයන් 03
1.3.3.රබර් පැළ තවාන්වල කාර්යයන් 03
1.4. සංවිධාන සටහන 04
1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 06
1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන 07
1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති තොරතුරු 07

2. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන්හි ප්‍රගතිය හා ඉදිරි දැක්ම 08-30

2.1. රබර් නැවත වගාව 08
2.1.1.රබර් නැවත වගාව - කුඩාවතු අංශය 08
2.1.2.රබර් නැවත වගාව - වැවිලි අංශය 10
2.2. රබර් නව වගාව 11
2.2.1.රබර් නව වගාව - කුඩා වතු අංශය 11
2.3. රබර් වගාව සඳහා සහනාධාර ගෙවීම 12
2.4. රබර් පැළ නිෂ්පාදනය හා බෙදාහැරීම 12
2.4.1.රජයේ පැළ තවාන් 12
2.4.2.පෞද්ගලික පැළ තවාන් 13
2.5. රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම 14
2.5.1.කිරි කැපුම් ශිල්පී පුහුණුව - සාමාන්‍ය 14
2.5.2.බද්ධකරුවන් පුහුණුව 15
2.5.3.ප්‍රාදේශීය කාර්යාල මඟින් පැවැත්වූ අනෙකුත් පුහුණු වැඩසටහන් 15
2.6. රබර් ඉඩම් සමීක්ෂණය 17
2.7. රබර් මහ සැලැස්ම - 2024 17
2.7.1.සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීම හා අලුත් රබර් වගා බිම්වල ඵලදායීතාවය වැඩිකිරීම 17
2.7.2.අතහැර දැමූ පරිණත රබර් ඉඩම් වල රබර් කිරි කැපීම තුළින් රටේ ස්වාභාවික රබර් නිෂ්පාදනය වැඩි කිරීම. 18
2.8. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු -2024 18
2.8.1.රබර් වගා බිම් ප්‍රමාණය 18
2.8.2.ශ්‍රී ලංකාවේ ස්වභාවික රබර් නිෂ්පාදනය -2024 19
2.8.3.රබර් නිෂ්පාදන වියදම 19
2.8.4.ස්වාභාවික රබර් අපනයනය 20
2.8.4.1 ශ්‍රී ලංකාවේ සමස්ත රබර් අපනයනය 20
2.8.4.2 සමස්ත රබර් අපනයන ආදායම 21
2.8.5. ස්වභාවික රබර් ආනයනය 22
2.8.5.1. රටවල් අනුව ස්වභාවික රබර් ආනයනය කළ ප්‍රමාණයන් 22
2.8.5.2. සමස්ත රබර් ආනයන වියදම (රටවල් අනුව) 23
2.8.6.රබර් මිල 24
2.8.6.1. රබර් වෙළෙඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබා ගත් මිලෙහි මාසික සාමාන්‍යය 24
2.8.6.2. කොළඹ රබර් වෙන්දේසි මිල සාමාන්‍යය 25
2.8.6.3. අන්තර් ජාතික රබර් මිල 26

2.9. බලපත්‍රලාභී රබර් වෙළඳුන් පිළිබඳ තොරතුරු 26
2.10. ඒකාබද්ධ අරමුදල 27
2.11. සෙස් බදු අය කිරීම. 28
2.12. 2024 වර්ෂයේ ඉදිකිරීම් ප්‍රගතිය 29
2.13. වසරේ ලබාගත් ජයග්‍රහණ මුහුණදුන් අභියෝග හා ඉලක්ක 30

3. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය 31-46

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 31
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 33
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 34
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 36
3.5. ආදායම් එකතු කිරීමේ කර්යසාධනය 36
3.6. වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය 36
3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 36
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරිමේ කාර්යසාධනය 37
3.9. විගණකාධිපති වාර්තාව 38

4. කාර්ය සාධන දර්ශක 47

5. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය 48-49

5.1. හදුනා ගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු 48
5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 49

6. මානව සම්පත් පැතිකඩ 50-52

6.1. සේවක සංඛ්‍යා කළමණාකරණය 50
6.2. ආයතන කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තය බලපා ඇති අයුරු 50
6.3. මානව සම්පත් සංවර්ධනය 2024 51

7. අනුකූලතා වාර්තාව 53-58

1. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, රටේ රබර් වගාවේ තිරසාර සංවර්ධනය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. 1953 අංක 36 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධා ර පනත හා 1956 අංක 11 දරන රබර් පාලන පනත මඟින් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය බලය දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇත.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් රබර් වගාකරුවන් ලියාපදිංචි කිරීම, රබර් නැවත වගාව හා නව වගාව සඳහා බලපත්‍ර නිකුත් කිරීම, පෞද්ගලික පැළ තවාන් ලියාපදිංචි කිරීම, රබර් ආශ්‍රිත වෙළෙඳාම සිදුකරනු ලබන ආයතන ලියාපදිංචිය, රබර් ආශ්‍රිත කර්මාන්තශාලා හා අපනයනකරුවන් ලියාපදිංචි කිරීම ,සෙස් බදු එකතු කිරීම, නැවත වගා හා නව වගා සඳහා කුඩා වතු හිමියන්ට උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නොමිලේ ලබාදීම, උසස් ගුණාත්මක බද්ධ රබර් පැළ නිෂ්පාදනය, ගොවි පුහුණු හා උපදේශන සේවා සිදුකිරීම වැනි සේවාවන් රාශියක් සිදුකරනු ලබයි.

එම සේවාවන් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය කාර්යාල පහක් ස්ථාපනය කර ඇති අතර එම කාර්යාලවලට අනුබද්ධිත රබර් පැළ තවාන් 08 ක් දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇත.

ප්‍රාදේශීය කාර්යාලය	ආවරණය කරනු ලබන දිස්ත්‍රික්ක	ප්‍රාදේශීය බල ප්‍රදේශයට අයත් රබර් පැළ තවාන /තවාන්
කළුතර	කළුතර	ඇගල්ඔය තවාන ගුරුගොඩ තවාන
කෑගල්ල	කෑගල්ල	වැලිකඩමුල්ල තවාන මීරිගම තවාන
	කුරුණෑගල	
	මහනුවර	
	වවුනියාව	
	අනුරාධපුර	
	නුවර එළිය	
	ගම්පහ	
	මාතලේ	
මොනරාගල	මොනරාගල	කුඹුක්කන තවාන පදියතලාව තවාන
	බදුල්ල	
	අම්පාර	
රත්නපුර	රත්නපුර	කරපිංච තවාන
	කොළඹ	
ගාල්ල	ගාල්ල	මිද්දෙණිය තවාන
	මාතර	
	හම්බන්තොට	

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම කොටස්කරු වීම.

මෙහෙවර

නෛතිකව දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ට අනුගතව ශ්‍රී ලංකාවේ රබර් වගාව හා රබර් වගාව ආශ්‍රිත කර්මාන්තයන්හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා ව්‍යාප්ති සේවා ක්‍රියාත්මක කිරීම

ආයතනයේ අරමුණු

- පවතින රබර් වගා ඉඩම්හි ඵලදායීතාවය ඉහළ නැංවීම හා රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම තුළින් දේශීය රබර් නිෂ්පාදනය ඉහළ නැංවීම.
- රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වැඩි කිරීම තුළින් රබර් සඳහා වැඩි මිලක් ලබා ගැනීම හා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම.
- ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය ඉහළ නැංවීම තුළින් සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- දේශීය දැව අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා දායක වීම.
- ස්වභාවික පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා වගාවේ තිරසාර භාවය තහවුරු කිරීම.

1.3 ආයතනයේ ප්‍රධාන කාර්යයන්

1.3.1 ප්‍රධාන කාර්යාලයේ කාර්යයන්

- ප්‍රධාන පනත් හා නෛතික මූලාශ්‍ර මඟින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.
- නැවත වගා සහ නව වගා සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම හා ප්‍රාදේශීය කාර්යාල මඟින් සහනාධාර ලබාදීම අධීක්ෂණය කිරීම.
- රජයේ තවාන් මඟින් උසස් වර්ගයේ බද්ධ රබර් පැළ නිෂ්පාදනය කිරීම හා ලබා දීම.
- රබර් වගාව හා වෙළෙඳාම සඳහා බලපත්‍ර ලබා දීම.
- රබර් වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදනය, දේශීය පරිභෝජනය, අපනයනය හා ආනයනය පිළිබඳ දත්ත හා තොරතුරු යාවත්කාලීන කර පවත්වා ගැනීම.
- රබර් වෙළෙඳ පොළ පිළිබඳව කුඩා රබර් වතු හිමියන් දැනුවත් කිරීම.
- ස්වභාවික රබර් නිෂ්පාදනය, පරිභෝජනය හා වෙළෙඳාම සම්බන්ධව අන්තර්ජාතික සංවිධාන සමඟ කටයුතු කිරීම.
- සෙස් අරමුදල් එකතු කිරීම හා පරිපාලනය.
- රබර් වගාවේ හා නිෂ්පාදනයේ ඒ ඒ අවධිවලට අදාලව කුඩා වතු ඉඩම් හිමියන් වෙත අවශ්‍ය දැනුම හා උපදෙස් ලබා දීම.
- කුඩා වතු ඉඩම් හිමියාගේ ආර්ථික උන්නතිය උදෙසා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රබර් අංශයේ ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා ප්‍රමුඛ ආයතනය ලෙස කටයුතු කිරීම.
- ප්‍රාදේශීය කාර්යාල අධීක්ෂණය කිරීම.

1.3.2. ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරන කාර්යයන්

- රබර් වගාව සඳහා බලපත්‍ර ලබා දීම හා ඉඩම් ලියාපදිංචි කිරීම.
- රබර් නැවත වගාව හා නව වගාව සිදු කිරීම.
- වගාකරුවන් සඳහා වගා සහනාධාර ලබා දීම ඇතුළු අනෙකුත් සේවා ලබාදීම.
- රබර් වෙළෙඳ හිමියන් සඳහා වෙළෙඳ බලපත්‍ර ලබා දීම.
- රජයේ රබර් පැළ තවාන් පවත්වාගෙන යාම, රබර් පැළ බෙදා හැරීම හා පුද්ගලික පැළ තවාන් අධීක්ෂණය.
- කුඩා වතු හිමියන් හා වතු හිමියන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
- රබර් වගාවට වැළඳෙන රෝග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය දැනුවත් කර රෝග පාලනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රබර් වගා හිමියන්ගේ ආර්ථික ශක්තිය නගා සිටුවීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- රබර් වගාව සම්බන්ධ දැනුම හා පුහුණුව ලබා දීම.

1.3.3. රබර් පැළ තවාන්වල කාර්යයන්

- රබර් පර්යේෂණායතනයේ නිර්දේශ මත නැවත වගාව හා නව වගාව සඳහා අවශ්‍ය ප්‍රමිතියෙන් උසස් බද්ධ රබර් පැළ නිෂ්පාදනය කිරීම.
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නව ක්ලෝන සොයා ගැනීම් වලට අනුව වැඩි දියුණු කරන ලද ප්‍රභේද ගොවීන්ට හඳුන්වා දීම.
- අවශ්‍ය අවස්ථාවලදී වැව්ලි සමාගම් වල පැළ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම.
- රබර් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ වගාවන් සඳහා අවශ්‍ය සහාය ලබා දීම.

1.4 සංවිධාන සටහන



අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී
අධ්‍යක්ෂ (සංවර්ධන)
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (කො.කා.)
කො.කා නිලධාරී
අධ්‍යක්ෂ (සැලසුම්)
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
*සංඛ්‍යාලේඛන නිලධාරී
*කො.කා.ස.
අධ්‍යක්ෂ (ව්‍යාප්ති)
ස.අධ්‍යක්ෂ (ව්‍යාප්ති)
අධ්‍යක්ෂ (පාලන)
නීති නිලධාරී
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (පාලන)
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
අධ්‍යක්ෂ (ප්‍රාදේශීය) ප්‍රාදේශීය කාර්යාල 5
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ
ජ්‍යෙ. ර.සං.නි.
ර.සං.නි.
සං.නි./ ක.සේ. නි.
කා.කා.ස./ රියැදුරු
*ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කරන ලද නිලධාරීන්

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

අනු අංකය	තනතුර	අනුමත ප්‍රමාණය	දැනට සිටින ප්‍රමාණය	පුරප්පාඩු ප්‍රමාණය	අතිරික්ත ප්‍රමාණය
1	අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ. - විශේෂ ශ්‍රේණිය)	1	1	0	0
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ. - විශේෂ ශ්‍රේණිය)	1	1	0	0
3	අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ- ප්‍රාදේශීය (ශ්‍රී ලං.ප.සේ -I ශ්‍රේණිය)	7	5	02	0
4	අධ්‍යක්ෂ (ශ්‍රී ලං.කෘ.සේ.-I ශ්‍රේණිය)	1	1	0	0
5	අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත)	1	0	1	0
6	ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ-I ශ්‍රේණිය)	1	1	0	0
7	ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී ලං.ග.සේ- I ශ්‍රේණිය)	1	1	0	0
8	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ(ශ්‍රී ලං.ප.සේ- II III ශ්‍රේණිය)	12	4	8	0
9	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ(සැලසුම්)(ශ්‍රී ලං.කෘ.සම්.සේ - II, IIIශ්‍රේණිය)	1	1	0	0
10	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත)	1	0	1	0
11	නීති නිලධාරි (දෙපාර්තමේන්තුගත)	1	0	1	0
12	ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ - II , III ශ්‍රේණිය)	6	4	2	0
13	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	1	0	1	0
14	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	2	1	1	0
15	පරිපාලන නිලධාරි (ක. සේ. නි. සේ. – අධිශ්‍රේණිය)	4	4	0	0
16	ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරි (දෙපාර්තමේන්තුගත - අධිශ්‍රේණිය)	17	9	8	0
17	භාෂා පරිවර්තක - සිංහල/දෙමළ (භා. ප. සේ)	1	0	1	0
18	තොරතුරු තාක්ෂණ නිලධාරි (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ)	2	1	1	0
19	තොරතුරු තාක්ෂණ සහකාර (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ)	5	2	3	0
20	සංවර්ධන නිලධාරි (සං. නි. සේ)	72	73	0	1
21	ගොඩනැගිලි නඩත්තු නිළධාරි (දෙපාර්තුමේන්තුගත)	1	1	0	0
22	රාජ්‍ය කළමණාකාර සහකාර (ක.සේ.නි.සේ)	120	114	6	0
23	කළමණාකාර සහකාර(තේ ශක්ති අරමුදල)	2	2	0	0
24	රබර් සංවර්ධන නිලධාරි (දෙපාර්තුමේන්තුගත)	170	102	68	0
25	රියදුරු (රි.සේ.)	40	23	17	0
26	රියදුරු (දෙපාර්තුමේන්තුගත)	1	0	1	0
27	ලොරි සහයක (දෙපාර්තුමේන්තුගත)	10	7	3	0
28	කාර්යාල කාර්ය සහයක (කා.කා.ස.)	33	27	6	0
	එකතුව	**515**	**385**	**131**	**1**

***2024.12.31**

වගු අංක I

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යයන් ප්‍රධාන අංශ 07 ක් යටතේ ක්‍රියාත්මක වේ. එම අංශ පහත පරිදි වේ.

1. පාලන අංශය
2. විගණන අංශය
3. ගිණුම් අංශය
4. සැලසුම් අංශය
5. සංවර්ධන අංශය
6. තොරතුරු තාක්ෂණ අංශය
7. ව්‍යාප්ති අංශය

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය



1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

විදේශ ආධාර ලබන ව්‍යාපෘති 2024 වසර තුළ දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක නොවීය.

2. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන්හි ප්‍රගතිය හා ඉදිරි දැක්ම.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2024 වසරේ හඳුනාගත් ඉලක්කයන්ට අනුව පහත සඳහන් වැඩසටහන් ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කර ඇත.

1. **රබර් නැවත වගා කිරීමේ වැඩසටහන (කුඩා වතු)**
2. **රබර් නව වගාකිරීමේ වැඩසටහන (කුඩා වතු)**
3. **බද්ධ රබර් පැළ නිෂ්පාදනය හා බෙදාහැරීම.**
4. **රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන්**
5. **රබර් ඉඩම් සමීක්ෂණය**
6. **රබර් මහ සැලැස්ම**

2.1. රබර් නැවත වගාව

රබර් වගාවක් ක්ෂේත්‍රයේ ස්ථාපනය කර වසර 30 කට ආසන්න කාලයක් ගත වන විට, එම ක්ෂේත්‍රයේ රබර් අස්වැන්න අඩුවන බැවින්, පරිණත රබර් ගස් ගලවා ඉවත් කර, රබර් නැවත වගා කිරීමේ අවශ්‍යතාවය මතු වේ. ඒ අනුව නැවත වගාව වෙත ගොවීන් නැඹුරු කරලීමට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් කුඩා වතු හිමියන් වෙත නැවත වගා කරනු ලබන ඉඩම් සඳහා අවශ්‍ය ගුණාත්මක බද්ධ රබර් පැළ නොමිලේ ලබාදීම සිදුකරයි.

2.1.1. රබර් නැවත වගාව - කුඩා වතු අංශය

2024 වසර සඳහා කුඩා වතු අංශයේ හෙක්. 295 ක් වූ රබර් නැවත වගා ඉලක්කය අනුව දෙපාර්තමේන්තුව අත් කරගෙන ඇති භෞතික ප්‍රගතියට අදාලතොරතුරු පහත වගුවේ දක්වා ඇත.

කුඩා වතු අංශය විසින් රබර් පැළ සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ

බිම් ප්‍රමාණය -2024

දිස්ත්‍රික්කය	ඉලක්කය (හෙක්.)	ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව	අයදුම්පත්‍රවලට අදාළබිම් ප්‍රමාණය (හෙක්.)	නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව	නිකුත් කළ බලපත්‍රවලට අදාළබිම් ප්‍රමාණය (හෙක්.)	බලපත්‍ර ලබාගත් බලපත්‍රලාභීන් සංඛ්‍යාව	නැවත වගාව සිදු කළ බලපත්‍රලාභීන් සංඛ්‍යාව	නැවත වගාව සිදුකළ බිම් ප්‍රමාණය (හෙක්.)	නැවත වගාව සඳහා පැළ ලබා දුන් ගොවීන් සංඛ්‍යාව	නැවත වගාව සඳහා නිකුත් කළ පැළ සංඛ්‍යාව
රත්නපුර	54	63	79.55	62	77.36	62	38	32.75	38	17,011
කොළඹ	16	24	17.65	23	15.01	23	17	14.53	17	6,831
කෑගල්ල	117	317	203.66	275	171.17	275	195	117.24	187	56,556
ගම්පහ	10	32	22.41	23	16.53	23	14	9.01	13	4,880
කුරුණෑගල	12	28	23.10	26	22.54	26	13	10.23	12	5,095
මහනුවර	9	26	15.07	26	15.07	26	14	7.35	13	3,591
මාතලේ	2	1	2.83	1	2.83	1	-	-	-	-
කළුතර	50	94	69.57	81	62.42	80	55	47.74	54	21,012
මොනරාගල	5	9	3.64	9	3.64	9	3	2.00	3	1,040
ගාල්ල	7	3	6.94	3	6.94	3	1	0.61	1	315
මාතර	13	21	19.88	21	19.88	21	9	7.08	9	3,823
හම්බන්තොට	-	1	0.71	1	0.71	1	1	0.71	1	367
එකතුව	**295**	**619**	**465.00**	**551**	**414.10**	**550**	**360**	**249.24**	**348**	**120,521**

වගු අංක II

2024 වර්ෂයේ දී කුඩා වතු අංශයේ රබර් නැවත වගාව සඳහා අයදුම් පත්‍ර 619 ක් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති අතර, ඉන් අයදුම් පත්‍ර 551 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර නිකුත් කර ඇත. එම බලපත්‍ර යටතේ බලපත්‍රලාභීන් 360 දෙනෙකු විසින් හෙක්. 249.24 ක භූමි ප්‍රමාණයක රබර් නැවත වගාව සිදු කර ඇත. 2024 වර්ෂයේ කුඩා වතු අංශයේ රබර් නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර් 295 ක් විය. ඒ අනුව රබර් නැවත වගාව 84.5% ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

2.1.2. රබර් නැවත වගාව - වැවිලි අංශය

වැවිලි සමාගම් විසින් 2024 වසරේ දී සිදු කළ රබර් නැවත වගාව පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

වැවිලි සමාගම්වල (රබර් නැවත වගාව) -2024

වැවිලි සමාගමේ නම	බලපත්‍ර නිකුත් කළ ඉඩම් ප්‍රමාණය (හෙක්.)	නැවත වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
කෑගල්ල වැවිලි සමාගම	117.03	104.21
කොටගල වැවිලි සමාගම	29.00	10.75
පුස්සැල්ලාව වැවිලි සමාගම	138.52	138.52
හොරණ වැවිලි සමාගම	150.31	150.31
කැළණිවැලි වැවිලි සමාගම	52.00	52.00
ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය	6.39	6.39
ලලාන් වැවිලි සමාගම (2024 සඳහා තොරතුරු ලබාදී නොමැති බැවින් 2023 තොරතුරු ඇතුලත් කරන ලදි)	153.73	131.50
එකතුව	**646.98**	**593.68**

වගු අංක III

2024 වසරේ වැවිලි සමාගම් 6ක් හා රබර් පර්යේෂණායතනය විසින් හෙක් 593.68 ක් රබර් නැවත වගාව සිදුකර ඇත.

2.2. රබර් නව වගාව

2.2.1. රබර් නව වගාව - කුඩා වතු අංශය

කුඩා වතු හිමියන් රබර් නව වගා කළ බිම් ප්‍රමාණය - 2024

දිස්ත්‍රික්කය	ඉලක්කය (හෙක්.)	ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව	අයදුම් පත්‍ර වලට අදාල බිම් ප්‍රමාණය (හෙක්.)	නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව	බලපත්‍ර නිකුත් කළ බිම් ප්‍රමාණය (හෙක්.)	නව වගාව සිදු කළ බලපත්‍රලාභීන් සංඛ්‍යාව	නව වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	නව වගා අවසන් කළ බලපත්‍රලාභීන් සංඛ්‍යාව	නව වගාව සඳහා පැළ ලබා දුන් ගොවීන් සංඛ්‍යාව	නව වගාව සඳහා නිකුත් කළ පැළ සංඛ්‍යාව
රත්නපුර	15	42	19.73	40	19.50	32	14.53	32	32	6,948
කොළඹ	5	24	9.55	23	9.42	16	6.63	16	16	3,863
කෑගල්ල	22	113	44.19	103	39.86	63	22.46	63	55	10,921
ගම්පහ	4	21	11.84	17	9.29	13	6.42	13	13	2,102
කුරුණෑගල	3	34	13.53	31	12.58	13	5.65	13	12	2,407
මහනුවර	2	18	7.46	18	7.46	7	2.15	7	7	1,134
මාතලේ	2	4	3.04	4	3.04	3	1.82	3	3	950
අනුරාධපුර	2	1	0.80	1	0.80	1	0.80	1	1	440
කළුතර	20	49	21.78	40	19.64	40	9.73	27	27	5,451
මොනරාගල	388.6	1,146	656.94	1005	575.22	631	351.62	631	631	182,965
බදුල්ල	35.54	86	49.22	86	49.22	51	26.19	51	51	13,534
අම්පාර	15.6	57	38.60	55	36.98	19	8.58	19	19	4,441
ගාල්ල	10	40	21.59	40	21.59	23	12.47	23	23	6,642
මාතර	10	28	18.74	28	18.74	15	11.90	15	15	6,393
හම්බන්තොට	5	31	14.64	31	14.64	19	8.15	19	19	4,628
එකතුව	**540**	**1694**	**931.65**	**1,522**	**837.98**	**946**	**489.10**	**933**	**924**	**252,819**

වගු අංක **IV**

2024 වසරේ නව රබර් වගාව සඳහා දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම යටතේ හඳුනාගත් ඉලක්කය හෙක්. 540 කි.

2024 වසරේ රබර් නව වගාව යටතේ වගා කිරීම සඳහා හෙක්ටයාර 931.65 ක් සඳහා වගාකරුවන් විසින් අයදුම් පත්‍ර ඉදිරිපත්කර තිබූ අතර ඉන් හෙක්ටයාර 837.98 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර නිකුත්කර ඇත. ඉන් හෙක්ටයාර 489.10 ක් ගොවීන් 933 ක් විසින් වගාකර ඇති අතර එය 90.57 %ක භෞතික ප්‍රගතියක් ලගාකර ගැනීමකි.

2017 වසර සිට 2024 වසර දක්වා ශ්‍රී ලංකාවේ රබර් නව වගාව සිදු කළ මුළු බිම් ප්‍රමාණය පහත වගුවේ දක්වා ඇත.

රබර් නව වගා බිම් ප්‍රමාණය 2017 – 2024 (හෙක්.)

වර්ෂය	කුඩා වතු	වැවිලි සමාගම්	එකතුව
2017	700	335	1,035
2018	981	48	1,029
2019	1,103	-	1,103
2020	726	25	751
2021	1,186	02	1,188
2022	489	15	504
2023	417	-	417
2024	489.10	70	559.1

වගු අංක V

2.3. රබර් වගාව සඳහා සහනාධාර ගෙවීම - 2024

දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේ සිදුකළ රබර් නව වගා සහ නැවත වගා සඳහා සහනාධාර ලෙස මූල්‍ය සහනාධාර ලබාදීම සිදු නොකළත්, පෙර වර්ෂවල වගාවන් සඳහා 2024 වර්ෂයේදී ලබාදුන් සහනාධාර මුදල් පිළිබඳ විස්තර පහත වගුවේ පරිදි වේ.

වැඩසටහන	ගෙවූ ප්‍රතිපාදනය (රු.මි.)	හෙක්ටයාර ප්‍රමාණය
රබර් නැවත වගා (කුඩාවතු අංශය)	99.679	2052.45
රබර් නැවත වගා (වැවිලි සමාගම් අංශය)	188.034	3920.54
රබර් නව වගා (කුඩාවතු අංශය)	80.196	2007.32
එකතුව	**367.909**	**7980.31**

වගු අංක VI

2.4. රබර් පැළ නිෂ්පාදනය හා බෙදාහැරීම

2.4.1 රජයේ පැළ තවාන්

ගුණාත්මක රබර් පැළ නිෂ්පාදනය කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති රබර් පැළ තවාන් 08 මගින් 2024 වසරේ සිදු කරන ලද රබර් පැළ නිෂ්පාදනය හා පැළ බෙදා හැරීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ පැළ තවාන්හි පැළ නිෂ්පාදනය සහ බෙදා හැරීම - 2024

තවානේ නම	පැළ නිෂ්පාදන ඉලක්කය	බද්ධය සාර්ථක වූ පැළ සංඛ්‍යාව	බෙදා හරින ලද පැළ සංඛ්‍යාව
කරපිංච	47,500	44,954	32,375
කුඹුක්කන	249,500	267,141	218,443
පදියතලාව	99,500	79,334	57,385
මිද්දෙණිය	49,000	35,408	24,375
වැලිකඩමුල්ල	70,000	34,124	22,372
මීරිගම	67,500	46,632	30,119
ඇගල්ඔය	39,500	22,279	19,661
ගුරුගොඩ	45,500	38,568	31,510
එකතුව	**668,000**	**568,440**	**436,240**

වගු අංක VII

2024 වර්ෂයේ පැළ 668,000ක නිෂ්පාදන ඉලක්කය සඳහා බද්ධය සාර්ථක වූ රබර් පැළ සංඛ්‍යාව 568,440 කි. ඉන් පැළ 376,240 ක් නව වගා, නැවත වගා හා පාළු පැළ සඳහා ක්‍රියාකාරී සැලැස්ම යටතේද පැළ 60,000 ක් රබර් මහ සැලැස්ම යටතේද ගොවීන් වෙත බෙදා හැරීමට කටයුතු කර ඇත.

2024 වර්ෂයේ රජයේ පැළ තවාන්හි පැළ බෙදා හැරීම අංශ අනුව පහත වගුවේ දක්වා ඇත.

තවානේ නම	2024 වසරේ නිකුත් කරන ලද පැළ සංඛ්‍යාව				එකතුව
	කුඩා වතු	වැවිලි සමාගම්	රබර් පර්යේෂණ ආයතනය	වෙනත්	
කරපිංච	24,903	-	-	7,472	32,375
කුඹුක්කන	218,443	-	-	-	218,443
පදියතලාව	57,385	-	-	-	57,385
මිද්දෙණිය	20,167	-	-	4,208	24,375
වැලිකඩමුල්ල	20,312	-	-	2,060	22,372
මීරිගම	28,729	-	-	1,390	30,119
ඇගල්ඔය	19,515	-	-	146	19,661
ගුරුගොඩ	30,250	450	760	50	31,510
එකතුව	**419,704**	**450**	**760**	**15,326**	**436,240**

වගු අංක VIII

2.4.2. පෞද්ගලික පැළ තවාන්

ශ්‍රී ලංකාවේ රබර් නැවත වගා හා නව වගා සඳහා වන වාර්ෂික පැළ අවශ්‍යතාවය මුළුමනින්ම සැපිරීම රජයේ තවාන් මඟින් සිදු නොවේ. වාර්ෂික බද්ධ රබර් පැළ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා පෞද්ගලික තවාන් හිමියන් මෙන්ම වැවිලි සමාගම් ද සැළකිය යුතු දායකත්වයක් සපයති. 2024 වර්ෂයේ දිස්ත්‍රික්ක අනුව පෞද්ගලික අංශයේ පැළ නිෂ්පාදනය හා බෙදා හැරීම පහත පරිදි වේ.

පැළ නිෂ්පාදනය හා බෙදා හැරීම - 2024 (පෞද්ගලික පැළ තවාන්)

දිස්ත්‍රික්කය	පැළ තවාන් සංඛ්‍යාව	2024 වර්ෂය තුළ නිෂ්පාදනය කළ පැළ සංඛ්‍යාව	2024 වර්ෂය තුළ නිකුත් කරන ලද පැළ සංඛ්‍යාව
රත්නපුර	6	213,112	126,097
කොළඹ	5	104,300	51,782
කෑගල්ල	19	175,733	120,767
ගම්පහ	5	13,500	6,550
මහනුවර	1	4,210	1,100
කළුතර	6	329,758	145,799
මොනරාගල	3	31,346	20,364
ගාල්ල	1	9,700	-
එකතුව	**46**	**881,659**	**472,459**

වගු අංක IX

2.5. රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම

2.5.1. කිරි කැපුම් ශිල්පී පුහුණුව - සාමාන්‍ය

රබර් වගාවේ ඵලදාව උපරිමව ලබා ගැනීම සඳහාත්, එම ඵලදාව දීර්ඝ කාලීනව ලබා ගැනීමටත් තාක්ෂණික ක්‍රමවේද අනුව කිරි කැපීම් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ක්ෂේත්‍රය තුළ එවැනි කිරි කපන්නන් සුලභ කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව ලබා දේ.

කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන (සාමාන්‍ය) - 2024

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ සංඛ්‍යාව	වැය කළ මුදල (රු.)
රත්නපුර	240	24	276	75,200.00
කෑගල්ල	460	46	550	171,000.00
මොනරාගල	650	65	650	247,000.00
කළුතර	160	13	185	37,400.00
ගාල්ල	120	12	131	45,600.00
එකතුව	**1630**	**160**	**1792**	**576,200.00**

වගු අංක X

2.5.2. බද්ධකරුවන් පුහුණු වැඩසටහන

ගුණාත්මක බවින් ඉහළ සාර්ථක බද්ධ රබර් පැළයක් නිෂ්පාදනය සඳහා විධිමත් ක්‍රමානුකූල දැනුමක් සහිත බද්ධකරුවෙකුගේ සහාය අවශ්‍ය වේ. ඒ අනුව, පැළ බද්ධ කිරීමේ කාර්යයේ නියුතු රජයේ පැළ තවාන්වල සේවකයින්, පුද්ගලික පැළ තවාන්කරුවන්, මෙන්ම පැළ බද්ධ කිරීමේ කාර්යය සඳහා යොමුවීමට කැමැත්තක් දක්වන ආධුනිකයින් මෙම පුහුණු වැඩසටහන සඳහා තෝරා ගැනේ.

බද්ධකරුවන් පුහුණුව - 2024

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණු කළ සංඛ්‍යාව	වැය කළ මුදල (රු.මි)
රත්නපුර	15	1	15	17,400.00
කෑගල්ල	40	2	57	27,240.00
කළුතර	40	2	39	25,290.00
ගාල්ල	15	1	24	28,100.00
මොනරාගල	60	2	60	41,500.00
එකතුව	**170**	**8**	**195**	**139,530.00**

වගු අංක XI

2.5.3. ප්‍රාදේශීය කාර්යාල මඟින් පැවැත්වූ අනෙකුත් පුහුණු වැඩසටහන්

ප්‍රාදේශීය කාර්යාලය	පුහුණු වැඩසටහන	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	වැඩසටහනට සහභාගීවූ සංඛ්‍යාව	වැයකළ මුදල(රු .)
රත්නපුර	පෞද්ගලික තවාන්හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන්	2	20	3,000.00
	රබර් වෙළෙඳ බලපත්‍රහිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන්	3	140	22,730.00
	පරිණත වගා බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	27	637	122,175.00
	අපරිණත වගා බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	24	605	114,846.00
	කන්න රැස්වීම්	18	195	32,483.00
	රබර් වගා රක්ෂණ ක්‍රමය පිළිබඳ පුහුණු වැඩසටහන	1	17	46,500.00
	තවාන් සංවර්ධන වැඩසටහන්	1	32	11,060.00
	රබර් මහා සැලැස්ම යටතේ කිරි නොකපන රබර් ඉඩම් ඵලදායී උපයෝජනය සඳහා වන වැඩසටහන්	4	196	530,635.00
කෑගල්ල	පෙර කන්න රැස්වීම්	47	1033	193,380.00
	පරිණත වගා බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන	50	1059	219,570.00
	අපරිණත වගා බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන	48	1493	287,480.00
	රබර් වෙළෙඳ බලපත්‍ර හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන	5	176	38,286.43

	පුද්ගලික තවාන් හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන	1	25	5,905.00
	තවාන් සංවර්ධන වැඩසටහන්	1	67	22,520.00
කළුතර	පෙර කන්න රැස්වීම්	20	88	14,400.00
	පරිණත වගා බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන	26	624	99,810.00
	අපරිණත වගා බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන	23	536	91,080.00
	රබර් වෙළෙඳ බලපත්‍ර හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන	1	135	30,862.00
	පුද්ගලික තවාන් හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන	1	12	2,437.53
	තවාන් සංවර්ධන වැඩසටහන්	1	44	81,485.00
	රබර් පර්යේෂණායතනය මඟින් සිදුකරනු ලැබූ තවාන් වැඩමුළුව	2	63	16,588.52
මොනරාගල	පෙර කන්න රැස්වීම්	32	1039	207,800.00
	පරිණත වගා බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන	22	564	113,200.00
	අපරිණත වගා බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන	22	660	132,000.00
	රබර් වෙළෙඳ බලපත්‍ර හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන	1	64	12,800.00
	තවාන් සංවර්ධන වැඩසටහන්	2	126	34,900.00
	රබර් පර්යේෂණායතනය මඟින් සිදු කරනු ලැබූ තවාන් වැඩමුළුව	1	40	21,600.00
ගාල්ල	පෙර කන්න රැස්වීම්	12	73	13,600.00
	පරිණත වගා බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන	1	11	1,675.00
	අපරිණත වගා බලපත්‍රලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන	8	55	11,000.00
	රබර් වෙළෙඳ බලපත්‍ර හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන	1	38	6,586.62
	නිවැරදි කෘෂි පිළිවෙත් අනුගමනය කිරීමේ වැඩසටහන	2	113	19,800.00
	පත්‍ර පතන රෝගය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	1	33	6,786.00
	මධ්‍ය පරිමාණ ඉඩම් හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන	1	56	66,168.24
එකතුව				**2,635,149.34**

වගු අංක XII

2.6. රබර් ඉඩම් සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ රබර් ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් අවසන් වරට පවත්වා ඇත්තේ 2010/2011 වර්ෂය පාදක කරගනිමින් වන අතර, එම සමීක්ෂණය පවත්වා වර්ෂ 10කට වඩා වැඩි කාලයක් ගතවී ඇති බැවින් රබර් ඉඩම් ප්‍රමාණය නිවැරදිව ගණනය කිරීම සඳහා 2023/2024 වර්ෂ පාදක කරගනිමින් රබර් ඉඩම් සමීක්ෂණයක් රබර් සංවර්ධන දෙපර්තමේන්තුව මඟින් සිදුකරන ලදි.

ප්‍රාදේශීය කාර්යාලය	මුළු රබර් බිම් ප්‍රමාණය -2024 (හෙක්ටයාර)
කෑගල්ල	31,086
රත්නපුර	20,245
මොනරාගල	14,865
ගාල්ල	4,363
කළුතර	13,443
එකතුව	**84,002**

වගු අංක **XIII**

2.7. රබර් මහ සැලැස්ම - 2024

රබර් මහ සැලැස්ම යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබීය.

1. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීම හා අලුත් රබර් වගා බිම්වල ඵලදායීතාවය වැඩිකිරීම
2. අතහැර දැමූ පරිණත රබර් ඉඩම් වල රබර් කිරි කැපීම තුළින් රටේ ස්වාභාවික රබර් නිෂ්පාදනය වැඩි කිරීම.

2.7.1. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීම හා අලුත් රබර් වගා බිම්වල ඵලදායීතාවය වැඩිකිරීම.

ඒ යටතේ මොනරාගල, අම්පාර සහ බදුල්ල දිස්ත්‍රික්ක පාදක කරගෙන පහත ක්‍රියාකාරකම් ඉටුකරන ලදි.

ක්‍රියාකාරකම	ඉලක්කය	ප්‍රගතිය (භෞතික)	වෙන්කල ප්‍රතිපාදනය (රු. මිලි.)	වියදම (රු. මිලි.)
රබර් වගා සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම සහ අදාල ආයතන වලින් රබර් වගාව සඳහා ඉඩම් නිදහස් කරගැනීම.	හෙක්. 115	හෙක්. 115	3.00	2.02
ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම	පැළ 60,000	පැළ 60,000	15.00	13.11

වගු අංක **XIV**

2.7.2. අතහැර දැමූ පරිණත රබර් ඉඩම් වල රබර් කිරි කැපීම තුළින් රටේ ස්වාභාවික රබර් නිෂ්පාදනය වැඩි කිරීම.

ඉහත ව්‍යාපෘතිය යටතේ සිදුකළ ක්‍රියාකාරකම් සහ ප්‍රගතිය පහත පරිදි වේ.

ක්‍රියාකාරකම	ඉලක්කය	ප්‍රගතිය (භෞතික)	වෙන්කල ප්‍රතිපාදනය (රු. මි.ලි.)	වියදම (රු. මි.ලි.)
කිරි නොකපන ලද රබර් ඉඩම් ලියාපදිංචි කිරීම සහ කිරි නොකපන ලද ඉඩම් හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	වැඩසටහන් 05	වැඩසටහන් 05	0.5	0.06
කුඩා, මධ්‍යම හා මහා පරිමාණ වතුවල කිරි කැපුම්කරුවන් සඳහා වෘත්තීය කිරි කැපුම්කරුවන් පුහුණුව ලබාදීම සහ ලියාපදිංචි නොකළ ඉඩම් සමඟ සම්බන්ධ කිරීම.	150 (පුද්ගලයින්)	195 (පුද්ගලයින්)	2.00	1.39

වගු අංක **XV**

2.8. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු - 2024

2.8.1. රබර් වගා බිම් ප්‍රමාණය

2010 වසරේ දිවයිනම ආවරණය වන පරිදි සිදු කරන ලද රබර් ඉඩම් සංගණනයේ දත්ත මත පදනම්ව වාර්ෂිකව සිදු කරනු ලබන නව වගා ප්‍රමාණය හා වගාවෙන් ඉවත් වන ඉඩම් ප්‍රමාණය අනුව 2023 වසර දක්වා ඇස්තමේන්තුගත රබර් ඉඩම් ප්‍රමාණය ගණනය කර ඇත. 2024 වර්ෂ පාදක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද රබර් ඉඩම් සමීක්ෂණයේ දත්ත මත පදනම්ව 2024 වසරේ ශ්‍රී ලංකාවේ රබර් ඉඩම් ප්‍රමාණය ගණනය කර ඇත.

රබර් ඉඩම් ප්‍රමාණය (2024)

වර්ෂය	ඇස්තමේන්තුගත බිම් ප්‍රමාණය (හෙක්.)		
	කුඩා වතු අංශය	ප්‍රාදේශීය වැවිලි සමාගම්/රාජ්‍ය වතු	එකතුව
2022	66,710	31,874	98,884
2023	67,039	31,354	98,393
2024	**48,292**	**35,710**	**84,002**

වගු අංක **XVI**

2.8.2 ශ්‍රී ලංකාවේ ස්වභාවික රබර් නිෂ්පාදනය - 2024

2024 වසරේ රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 69,185 කි. එය 2023 වර්ෂයේ රබර් නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 64,444 ට සාපේක්ෂව 7.35% ක වර්ධනයකි. 2024 වසරේ රබර් මිල ඉහළ යාම 2024 වර්ෂය තුළ 2023 වර්ෂයට සාපේක්ෂව අඩු වර්ෂාපතනයක් පැවතීමත්, පත්‍ර පතන රෝගය වගා භූමි තුළ පාලනය වීමත් යන කරුණු 2024 වසරේ රබර් නිෂ්පාදනය ඉහළ යාම සඳහා මූලික වශයෙන් හේතු වී ඇත.

ලෝක රබර් නිෂ්පාදනය - 2024 (කිලෝ ග්‍රෑම් මිලියන)

	රට	රබර් නිෂ්පාදනය 2022	රබර් නිෂ්පාදනය 2023	රබර් නිෂ්පාදනය 2024
01	තායිලන්තය	4,786	4,810	4,789
02	ඉන්දුනීසියාව	2,717	2,241	2,262
03	වියට්නාමය	1,340	1,270	1,297
04	චීනය	862	835	880
05	ඉන්දියාව	843	849	876
06	මැලේසියාව	377	348	386
07	කාම්බෝජය	382	392	407
08	මියන්මාරය	399	454	470
09	පිලිපීනය	208	189	176
10	ශ්‍රී ලංකාව	71	64	69
11	බංගලාදේශය	23	23	23
12	පැපුවා නිව්ගිනියා	6	6	6
13	අනෙකුත් රටවල්	2,585	2,869	3,183
	ලෝක නිෂ්පාදනය	**14,599**	**14,350**	**14,824**

මූලාශ්‍රය- ස්වාභාවික රබර් නිෂ්පාදනය කරන රටවල සංගමයේ (ANRPC) දත්ත ඇසුරෙන්

වගු අංක **XVII**

ඉහත වගුවට අනුව 2024 වසරේ ලෝක රබර් නිෂ්පාදනය මෙ.ටො.දහස් 14,824 ක් වේ. ඒ අනුව, 2023 වර්ෂයට සාපේක්ෂව ලෝක රබර් නිෂ්පාදනය මෙ.ටො. දහස් 474 කින් වැඩි වී ඇත. 2024 වර්ෂයේදී රබර් නිෂ්පාදනයේ ප්‍රමුඛයා වී ඇත්තේ අග්නිදිග ආසියාතික රටක් වන තායිලන්තයයි.

2.8.3 රබර් නිෂ්පාදන වියදම

රබර් නිෂ්පාදන වියදම 2021 – 2024 (කි.ග්‍රෑම් 1 කට රුපියල්)

වර්ෂය	වැවිලි සමාගම්	කුඩා වතු අංශය
2021	364.91	221.00
2022	369.43	288.00
2023	486.00	302.00
2024	499.92	386.08

වගු අංක **XVIII**

2.8.4 ස්වාභාවික රබර් අපනයනය

2023 වර්ෂය සමඟ සසඳන විට 2024 වර්ෂයේදී ලංකාවේ රබර් අපනයනයේ අඩුවීමක් සිදු වී ඇත. එනම්, 2023 වර්ෂයේ ස්වාභාවික රබර් මෙ.ටො. 12,673 ක්ව පැවති අපනයනය ප්‍රමාණය 2024 වර්ෂයේ මෙ.ටො. 8,633 ක් දක්වා පෙර වර්ෂයට සාපේක්ෂව 31.87% කින් පහළ යාමකි.

2.8.4.1 ශ්‍රී ලංකාවේ සමස්ත රබර් අපනයනය

2024 වසරේදී සමස්ත රබර් අපනයන ආදායම ලෙස රු.මි. 302,748 ක් ලබමින් ඩොලර් බිලියන 01 ක් ඉක්මවූ වටිනාකමක් දේශීය ආර්ථිකයට එකතු කිරීමට රබර් අංශයට හැකියාව ලැබී ඇත.

මුළු රබර් අපනයන ප්‍රමාණය සහ අපනයන ආදායම - 2024

වර්ගය	අපනයනය කළ ප්‍රමාණය	අපනයනය ආදායම (රු.මි.)
ස්වභාවික රබර් (මෙ.ටො)	8,633	7,832
කෘත්‍රිම රබර් (මෙ.ටො)	109	10
අර්ධ නිමි රබර් (මෙ.ටො)	11,309	1,297
නිමි භාණ්ඩ (මෙ.ටො)	60,007	112,313
සමස්ත රබර් අපනයන ප්‍රමාණය (මෙ.ටො)	80,058	121,452
නිමි භාණ්ඩ (ඒකක)	30,904,424	181,296
සමස්ත රබර් අපනයන ප්‍රමාණය (ඒකක)	30,904,424	181,296
එකතුව		**302,748**

වගු අංක **XIX**

2.8.4.2 සමස්ත රබර් අපනයන ආදායම (රටවල් අනුව) 2024

	රට	අපනයන ආදායම (රු. මි)	%
01	ඇමෙරිකා එක්සත් ජනපදය	99,814.89	32.97
02	ජර්මනිය	28,886.18	9.54
03	බෙල්ජියම	19,216.61	6.35
04	ඉතාලිය	14,770.52	4.88
05	බ්‍රසීලය	12,881.02	4.25
06	ප්‍රංශය	11,646.54	3.85
07	එක්සත් රාජධානිය	10,285.56	3.4
08	කැනඩාව	9,824.17	3.24
09	ඕස්ට්‍රේලියාව	7,959.28	2.63
10	ඉන්දියාව	7,717.59	2.55
11	අනෙකුත් රටවල්	79,746.39	26.34
සමස්ත රබර් අපනයන ආදායම		**302,748.75**	**100**

වගු අංක **XX**

ශ්‍රී ලංකාවේ ස්වභාවික රබර් මිලදී ගත් ප්‍රධාන රටවල් 2024

	රට	මිලදී ගත් ප්‍රමාණය (මෙ.ටො.)	ප්‍රතිශතය %
01	පකිස්ථානය	2,328.46	26.97
02	ජපානය	1,216.10	14.09
03	ජර්මනිය	986.44	11.43
04	චීනය	842.16	9.76
05	ඉන්දියාව	815.90	9.45
06	දකුණු අප්‍රිකාව	356.00	4.12
07	ඇමෙරිකා එක්සත් ජනපදය	307.55	3.56
08	ඉතාලිය	261.00	3.02
09	වියට්නාමය	247.30	2.87
10	ප්‍රංශය	133.00	1.54
11	වෙනත් රටවල්	1,138.78	13.19
එකතුව		**8,632.69**	**100.00**

වගු අංක **XXI**

2.8.5 ස්වභාවික රබර් ආනයනය

2024 වර්ෂය තුළ ස්වාභාවික රබර් මෙට්‍රික් ටොන් 67,331 ක් ආනයනය කර ඇති අතර එම අගය 2023 වර්ෂයේ ආනයනය කළ ප්‍රමාණය වන මෙ.ටො. 37,295 ක ප්‍රමාණයකට සාපේක්ෂව 80.5 % ක ඉහළ යෑමකි.

මුළු රබර් ආනයනය - 2024

වර්ගය	ආනයනය කළ ප්‍රමාණය	ආනයන වියදම (රු.මි.)
ස්වභාවික රබර් (මෙ.ටො)	67,331	37,669
කෘත්‍රිම රබර් (මෙ.ටො)	68,317	38,221
අර්ධ නිමි රබර් (මෙ.ටො)	34,845	10,768
නිමි භාණ්ඩ (මෙ.ටො)	9,679	16,012
සමස්ත රබර් ආනයන ප්‍රමාණය (මෙ.ටො)	180,172	102,670
නිමි භාණ්ඩ (ඒකක)	3,299,945	20,035
සමස්ත රබර් ආනයන ප්‍රමාණය (ඒකක)	3,299,945	20,035
එකතුව	**-**	**122,705**

වගු අංක XXII

2023 වර්ෂයට සාපේක්ෂව 2024 වසරේ ආනයන ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර, ආනයන වියදම රු.මි. 122,705 ක් වේ. එය 2023 වර්ෂයේ ආනයන වියදම වූ රු.මි 86,587 ට සාපේක්ෂව 41.7% ක ඉහළ යාමකි.

2.8.5.1. රටවල් අනුව ස්වභාවික රබර් ආනයනය කළ ප්‍රමාණයන් - 2024

රට		ආනයනය කළ ප්‍රමාණය(මෙ.ටො.)	ප්‍රතිශතය (%)
01	වියට්නාමය	25,133.74	37.33
02	තායිලන්තය	23,200.07	34.45
03	ඉන්දුනීසියාව	6,894.70	10.24
04	මැලේසියාව	3,668.18	5.45
05	අයිවරි කොස්ට්	2,750.70	4.08
06	ඉන්දියාව	1,675.30	2.49
07	ස්විස්ටර්ලන්තය	1,229.76	1.83
08	සිංගප්පූරුව	887.09	1.32
09	බංගලාදේශය	604.00	0.9
10	ජර්මනිය	504.00	0.75
11	අනෙකුත් රටවල්	783.02	1.16
එකතුව		**67,330.56**	**100.00**

වගු අංක XXIII

2.8.5.2. සමස්ත රබර් ආනයන වියදම (රටවල් අනුව) - 2024

රට		ආනයන වියදම (රු.මි)	ප්‍රතිශතය (%)
01	තායිලන්තය	17,681.08	14.41
02	ඉන්දියාව	15,757.35	12.84
03	වියට්නාමය	14,176.05	11.55
04	චීනය	14,139.88	11.52
05	ජපානය	10,131.47	8.26
06	මැලේසියාව	9,568.40	7.80
07	දකුණු කොරියාව	8,006.03	6.53
08	තායිවානය	6,230.99	5.08
09	ඉන්දුනීසියාව	5,328.65	4.34
10	බ්‍රසීලිය	4,566.77	3.72
11	අනෙකුත් රටවල්	17,118.06	13.95
එකතුව		**122,704.73**	**100.00**

වගු අංක **XXIV**

2.8.6. රබර් මිල

2.8.6.1. රබර් වෙළෙඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබාගත් මිලෙහි මාසික සාමාන්‍ය

(Farm Gate Price) 2024

මාසය	ෂීට් රබර් (ආර්.එස්.එස්)					ලේටෙක්ස් (රබර් කිරි)	ඔට්ටපාලු
	1	**2**	**3**	**4**	**5**		
ජනවාරි	616.42	611.65	605.94	596.43	596.96	544.67	294.11
පෙබරවාරි	595.49	591.29	586.23	583.88	581.47	517.79	293.03
මාර්තු	611.77	606.93	598.91	595.42	594.11	549.96	305.70
අප්‍රේල්	627.51	623.47	615.99	613.84	613.22	558.19	314.66
මැයි	599.42	594.69	580.12	576.88	575.64	556.17	309.42
ජූනි	598.90	595.84	584.44	584.17	583.54	570.14	316.67
ජූලි	654.96	643.04	618.88	614.50	612.79	594.58	322.32
අගෝස්තු	677.05	658.60	645.49	639.54	636.86	616.29	338.25
සැප්තැම්බර්	714.67	697.55	673.36	667.02	665.74	621.91	352.06
ඔක්තෝබර්	749.84	731.62	709.58	700.80	701.44	659.35	374.48
නොවැම්බර්	701.02	684.90	643.93	647.10	645.31	662.24	358.96
දෙසැම්බර්	665.93	637.83	626.91	609.74	608.25	636.27	337.43
සාමාන්‍ය අගය	**651.08**	**639.78**	**624.15**	**619.11**	**617.94**	**590.63**	**326.43**

වගු අංක XXV

2.8.6.2 කොළඹ රබර් වෙන්දේසි මිල සාමාන්‍ය

කොළඹ රබර් වෙන්දේසියේ රබර් වර්ගවල සාමාන්‍ය මිල -2024
AVERAGE COLOMBO RUBBER AUCTION PRICES - 2024

මාසය	ෂීට් රබර් (ආර්.එස්.එස්)					ලේටෙක්ස් ක්‍රේප්					ස්ක්‍රැප් ක්‍රේප්					
	1	2	3	4	5	1X	1	2	3	4	1XBR	2XBR	3XBR	No.4	F.B.	SKIM
ජනවාරි	658.33	Unq	625.00	600.00	Unq	Unq	800.00	703.75	649.50	617.50	584.50	521.50	513.50	490.00	490.00	523.33
පෙබරවාරි	650.50	644.00	633.33	624.00	607.50	800.00	790.00	714.50	677.50	583.00	549.33	546.50	541.00	524.00	512.50	481.00
මාර්තු	686.50	665.00	Unq	620.00	615.00	760.00	754.00	722.00	708.75	590.50	539.75	524.75	523.33	516.50	510.00	490.67
අප්‍රේල්	645.00	640.00	625.00	615.00	600.00	771.25	760.75	727.00	679.30	585.80	560.00	550.00	544.60	539.50	unq	493.83
මැයි	unq	unq	unq	unq	unq	777.50	765.00	731.67	681.25	578.75	545.00	unq	540.20	528.33	unq	490.00
ජූනි	675.00	unq	unq	unq	unq	unq	800.00	775.00	755.00	595.00	571.50	unq	559.33	548.33	537.50	523.00
ජූලි	700.00	665.00	650.00	625.00	680.00	890.60	882.80	868.40	838.00	688.00	648.60	645.00	629.60	625.50	unq	573.40
අගෝස්තු	Unq	Unq	Unq	Unq	Unq	950.00	948.25	930.75	847.50	736.25	677.50	671.00	662.10	660.00	640.00	642.50
සැප්තැම්බර්	752.00	Unq	720.00	695.00	Unq	1,026.25	1,012.25	972.50	876.25	720.00	685.00	676.00	667.50	653.75	625.00	674.33
ඔක්තෝබර්	810.50	Unq	Unq	Unq	Unq	1,068.75	1,065.00	1,008.00	960.00	816.00	770.00	700.00	677.40	667.50	660.00	698.80
නොවැම්බර්	802.50	Unq	Unq	Unq	Unq	1,100.00	1,055.00	1,005.00	941.25	837.50	733.33	Unq	629.00	625.00	600.00	652.50
දෙසැම්බර්	760.00	Unq	Unq	Unq	Unq	1,050.00	1,046.67	971.25	912.50	805.00	675.00	Unq	563.00	550.00	Unq	559.00
සාමාන්‍ය	**714.03**	**653.50**	**650.67**	**629.83**	**625.63**	**919.44**	**889.98**	**844.15**	**793.90**	**679.44**	**628.29**	**604.34**	**587.55**	**577.37**	**571.88**	**566.86**

***Unq –** ඉදිරිපත් වී නොමැත

වගු අංක XXVI

2.8.6.3 අන්තර් ජාතික රබර් මිල (2017-2024)

වර්ෂය	ශ්‍රී ලංකා රුපියල්			
	කොළඹ වෙන්දේසි මිල(රු.) (RSS 3)	බැංකොක් වෙන්දේසි මිල(රු.) (RSS 3)	කොට්ටයාම් වෙන්දේසි මිල(රු.) (RSS 4)	සයිකොම් වෙන්දේසි මිල(රු.) (RSS 3)
2017	324.50	311.69	322.75	307.70
2018	263.11	257.00	301.80	256.01
2019	272.43	296.90	343.08	297.05
2020	318.86	327.01	339.82	322.17
2021	435.52	389.13	443.64	416.54
2022	556.56	619.89	676.16	585.65
2023	503.10	564.71	605.20	575.34
2024	**650.67**	**728.88**	**711.79**	*

*වාර්තා වී නොමැත

වගු අංක **XXVII**

2.9. බලපත්‍රලාභී රබර් වෙළෙඳුන් පිළිබඳ තොරතුරු

2024 වසරේදී රබර් මිලදී ගැනීම සඳහා රබර් වෙළඳුන් වෙත බලපත්‍ර ලබාදුන් ආකාරය දිස්ත්‍රික්ක වශයෙන් පහත පරිදි වේ.

දිස්ත්‍රික්කය	අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව	නිකුත් කළ නව බලපත්‍ර සංඛ්‍යාව	එකතුව
රත්නපුර	124	4	128
කොළඹ	40	3	43
මොනරාගල	47	22	69
බදුල්ල	3	2	5
අම්පාර	0	1	1
ගාල්ල	50	25	75
මාතර	25	2	27
හම්බන්තොට	1	0	1
කෑගල්ල	140	18	158
ගම්පහ	23	0	23
කුරුණෑගල	6	0	6
මහනුවර	8	0	8
මාතලේ	0	0	0
කළුතර	139	3	142
එකතුව	**606**	**80**	**686**

වගු අංක **XXVIII**

2.10. ඒකාබද්ධ අරමුදල

වියදම් විෂය		වෙන්කළ ප්‍රතිපාදනය (රු.මි)	2024.12.31දිනට ශුද්ධ වියදම (රු.මි)
පුනරාවර්තන වියදම්			
වැටුප් හා වේතන	1001	186,000,000.00	167,564,609.95
අතිකාල හා නිවාඩු දින වැටුප්	1002	5,000,000.00	4,112,615.35
වෙනත් දීමනා	1003	117,730,000.00	115,431,664.64
ගමන් වියදම් - දේශීය	1101	14,000,000.00	13,985,849.46
ගමන් වියදම් - විදේශීය	1102	2,000,000.00	29,714.25
ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	1201	8,000,000.00	7,380,485.83
ඉන්ධන- ඉන්දන දීමනාව	1202-002	6,500,000.00	4,209,965.32
ඉන්ධන- සංචිත වාහන සඳහා ඉන්ධන	1202-009	9,500,000.00	9,297,198.97
ඉන්ධන- වෙනත් කටයුතු සඳහා ඉන්ධන	1202-010	1,000,000.00	821,627.41
ආහාරපාන සහ නිල ඇඳුම්	1203	218,000.00	152,000.00
වෙනත්	1205	782,000.00	760,466.14
වාහන	1301	8,000,000.00	7,956,261.61
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1302	1,250,000.00	1,238,583.83
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	1303	1,000,000.00	880,242.55
මෘදුකාංග නඩත්තු	1304	0.00	0.00
ප්‍රවාහනය	1401	2,750,000.00	2,424,263.06
තැපැල් හා සන්නිවේදනය	1402	5,500,000.00	4,948,630.58
විදුලිය හා ජලය	1403	4,000,000.00	3,014,522.58
බදුකුලී සහ පළාත් පාලන ආයතන බදු	1404	38,000,000.00	37,206,622.39
පිරිසිදු කිරීම් සහ පවිත්‍රතා සේවා	1405	5,000,000.00	4,840,548.91
ආරක්ෂක සේවා	1407	5,000,000.00	4,931,654.94
වෙනත් - යන්ත්‍ර සහ කාර්යාල උපකරණ සේවා ගිවිසුම්	1409-138	450,000.00	415,779.24
වෙනත්- වාහන රක්ෂණ	1409-139	1,000,000.00	963,852.54
වෙනත්-විවිධ සේවා වියදම්	1409-140	1,000,000.00	999,716.40
සම්මාදම් සහ දායක මුදල්	1505	1,900,000.00	1,815,477.21
රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී	1506	1,450,000.00	1,396,171.72
එකතුව (පුනරාවර්තන වියදම්)		**427,030,000.00**	**396,778,524.88**
මූලධන වියදම්			
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2001	10,000,000.00	9,589,988.07
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2002	2,000,000.00	1,984,324.15
වාහන	2003	11,000,000.00	7,706,896.88
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2103	1,000,000.00	994,746.50
මෘදුකාංග සංවර්ධනය	2106	2,000,000.00	1,731,176.47
කාර්ය මණ්ඩල පුහුණු	2401	1,000,000.00	997,100.50
සංවර්ධන සහායන්	2202	518,198,000.00	515,089,850.27
පර්යේෂණ සහ සංවර්ධන	2507	1,000,000.00	956,304.02
එකතුව (මූලධන වියදම)		**546,198,000.00**	**539,050,386.86**
එකතුව (සම්පූර්ණ)		**973,228,000.00**	**935,828,911.74**

වැය අංක **XXIX**

2.11. සෙස් බදු අය කිරීම.

2007 අංක 01 දරන සෙස් බදු නියෝගවලට අනුව ශ්‍රී ලංකාව තුළ රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන්ගෙන් එම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දේශීය වශයෙන් මිල දී ගන්නා ස්වාභාවික රබර් සඳහා මිලදී ගනු ලබන අමු රබර් කි.ග්‍රෑ 1 ක් සඳහා රු. 4/- බැගින් සෙස් බදු අය කරනු ලැබේ. ඒ අනුව 2024 වසරේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සෙස් බදු අය කිරීම පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

සෙස් බදු සඳහා ලියාපදිංචි ආයතන විස්තරය - 2024

2024 වර්ෂය සඳහා ලියාපදිංචි රබර් ආශ්‍රිත නිෂ්පාදන ආයතන සංඛ්‍යාව - 155

සෙස් බදු ගෙවූ ආයතන සංඛ්‍යාව - 58

දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බදු ප්‍රමාණය මාසිකව– 2024

මාසය	දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)
ජනවාරි	14.78
පෙබරවාරි	19.96
මාර්තු	12.53
අප්‍රේල්	17.53
මැයි	12.40
ජුනි	14.11
ජූලි	11.09
අගෝස්තු	15.54
සැප්තැම්බර්	13.94
ඔක්තෝබර්	22.02
නොවැම්බර්	10.19
දෙසැම්බර්	9.40
එකතුව	**173.49**

වගු අංක XXX

සෙස් බදු නියෝගවලට අනුව රබර් ආනයනය හා අපනයනය මත ශ්‍රී ලංකා රේගුව මඟින් 2024 වසරේ අය කරන ලද සෙස් බදු මුදල් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

අපනයනය හා ආනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය මාසිකව– 2024

මාසය	ආනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)	අපනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)
ජනවාරි	458.40	3.25
පෙබරවාරි	385.90	4.74
මාර්තු	374.14	4.70
අප්‍රේල්	392.99	2.93
මැයි	361.22	4.43
ජූනි	270.69	4.47
ජූලි	472.62	3.07
අගෝස්තු	371.18	3.37
සැප්තැම්බර්	495.26	3.08
ඔක්තෝබර්	524.21	3.53
නොවැම්බර්	425.64	2.46
දෙසැම්බර්	482.70	2.98
එකතුව	**5,014.95**	**43.01**

වගු අංක **XXXI**

2.12 2024 වර්ෂයේ ඉදිකිරීම් ප්‍රගතිය

වැඩ විෂය	ඇස්තමේන්තු ගත මුදල (රු.මි.)	භෞතික ප්‍රගතිය %	වියදම (රු.මි.)
ඇල්පිටිය රබර් සංවර්ධන නිලධාරී නිල නිවසේ වහළ කොටස සහ වහළ ආධාරක සිමෙන්ති කණුව අළුත්වැඩියා කිරීම.	0.130	100%	0.116
රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ වහල, ලේඛනාගාරය හා අපවහන පද්ධතිය අළුත්වැඩියාව	1.137	100%	0.941
කිරි ඇල්ල රබර් සංවර්ධන නිලධාරී නිල නිවාස අංක 02 හි අළුත්වැඩියාව	0.293	100%	0.251
දොඩන්ගොඩ රබර් සංවර්ධන නිලධාරි කාර්යාලයේ වහල සහ විදුලි පද්ධතිය අළුත්වැඩියාව	1.538	100%	1.425
අගලවත්ත රබර් සංවර්ධන නිලධාරී කාර්යාලයේ ජල සැපයීම් පද්ධතිය හා විදුලි පද්ධතිය අළුත්වැඩියාව	1.224	100%	1.099
විදුලි සැපයුම ලබා ගැනීම	0.047	100%	0.047
කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ අභ්‍යන්තර වෙන් කිරීම් හා දොර අළුත්වැඩියාව	0.254	100%	0.187

මොනරාගල ප්‍රාදේශීය කාර්යාලයේ ඉහල මහලේ වැසිකිලි පද්ධතිය අළුත්වැඩියාව	0.389	100%	0.378
මොනරාගල රබර් සංවර්ධන නිලධාරි කාර්යාලය අළුත්වැඩියාව	2.379	100%	2.346
බඩල්කුඹුර රබර් සංවර්ධන නිලධාරි කාර්යාලය අළුත්වැඩියාව	0.299	100%	0.285
වැලිකඩමුල්ල තවානේ ගබඩාවේ වහලය අළුත්වැඩියාව - පියවර 1	0.980	100%	0.765
වැලිකඩමුල්ල තවානේ ගබඩාවේ සිවිලිම අළුතින් යෙදීම	0.455	100%	0.442
තෝලංගමුව රබර් සංවර්ධන නිල නිවාසයේ අළුත්වැඩියාව	0.625	100%	0.618
තෝලංගමුව රබර් සංවර්ධන නිල නිවාසයේ ජල සැපයුම ලබා ගැනීම	0.069	100%	0.069
කොටියාකුඹුර රබර් සංවර්ධන නිලධාරී නිල නිවාසයේ විදුලි පද්ධතිය අළුත්වැඩියාව	0.297	100%	0.297
මුළු එකතුව	**10.116**	**100%**	**9.266**

වගු අංක **XXXII**

2.13 වසරේ ලබාගත් ජයග්‍රහණ, මුහුණදුන් අභියෝග හා ඉලක්ක

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂය තුළ ඉහළ මූල්‍ය සහ භෞතික ප්‍රගතියක් ලඟාකර ගැනීම දෙපාර්තමේතුව ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

නමුත් වන විනාශය සම්බන්ධ යුරෝපා සංගම් රෙගුලාසි (EUDR) දෙපාර්තමේන්තුව 2024 වර්ෂය තුළ මුහුණදුන් එක් අභියෝගයකි. ඒ අනුව සැපයුම් දාමයන් වන විනාශයට දායක නොවන බව සහතික කිරීම සඳහා වගා කරන ප්‍රදේශ නිවැරදිව සිතියම්ගත කිරීම වෙනුවෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සියළු පාර්ශවකරුවන් හා එක්ව කටයුතු කරමින් සිටියි.

.

